<u>අපි වෙනුවෙන් අපි අරමුදල - 2012</u>

1. **මූල්‍ය ප්‍රකාශන**

-----------------

**මතය**

----------

මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට අපි වෙනුවෙන් අපි අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2. **මූල්‍ය සමාලෝචනය**

---------------------

**මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මෙහෙයුම් වලින් ජනනය වූ මූල්‍ය ප්‍රතිඵලය රු.31,488,143 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.86,634,147 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.55,146,004 ක පිරිහීම සඳහා පරිත්‍යාග රු.6,162,625 කින්ද , සම්ප්‍රේෂණ කුළුණු ආදායම රු.54,040,581 කින්ද, රණජයපුර නිවාස ව්‍යාපෘතියේ වාරික මුදල් රු.20,054,493 කින්ද , ආයෝජන පොලී රු.18,179,427 කින්ද , අත් පළදනා වැඩ සටහනේ ආදායම රු.4,329 කින්ද වැඩිවීම සහ ව්‍යාපෘති වියදම් රු.153,567,735 කින්ද, බැංකු ගාස්තු රු.1,747 කින්ද, ක්ෂයවීම් රු.17,977 කින්ද, වැඩිවීම හේතුවී තිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

**කළමනාකරණ අකාර්යක්ෂමතා**

--------------------------------------

ඉපලෝගම රණජයපුර නිවාස ව්‍යාපෘතියෙන් නිවාස ලබාදෙනු ලබන ත්‍රිවිධ හමුදා සාමාජිකයන්ගෙන් නිවසක් සඳහා රු.800,000 ක මුදලක් රු.4,000 බැගින් වූ මාසික වාරික 200 කින් ආපසු අය කළයුතු වුවද, 2012 දෙසැම්බර් මස වන විට නිවාස 55 ක් සඳහා අයවිය යුතු රු.2,640,000 ක් වූ වාරික මුදල් අයකර ගැනීමට අරමුදල අපොහොසත් වී තිබුණු අතර එම වාරික මුදල් අයවිය යුතු වාරික මුදල් වශයෙන් ගිණුම්ගත කිරීමටද කටයුතු කර නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5 (4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 4.2 වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම

සංයුක්ත සැලැස්මට අනුකූලව 2010 සහ ඉන් ඉදිරියට වාර්ෂික ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කළයුතු වුවත් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාර සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 4.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2002 සැප්තැම්බර් 12 දින හා 2004 පෙබරවාරි 20 වන දින දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ 402 හා 402(1) ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත අපි වෙනුවෙන් අපි අරමුදල විසින් පිළියෙල කළයුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත ගත කළයුතු වවත් සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව 2013 අගෝස්තු 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 4.4 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වු අඩුපාඩු පිළිබඳව වරින්වර අරමුදලේ ලේකම්වරයා දැනුවත් කරන ලද අතර පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ විශේෂ අවධානය යොමු කළයුතු වේ.

(අ) ණය වාරික අයකර ගැනීම.

(ආ) මුදල් ආයෝජනය කිරීම.

(ඇ) සැලසුම් සකස් කිරීම.